(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 2(5).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා**

## 2016 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

මුදල් අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 240— වැඩසටහන 2,—† 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය විසින් ලබාගන්නා ලද ණය මුදලකින් මාරු කරන ලද හෝ මුදලින් රුපියල් මිලියන පනස් පහක් නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු ය.

මෙහි උපලේඛනයේ දක්වා ඇති සේවාවන් වෙනුවෙන්

(අ) 2015 මුදල් වර්ෂය සඳහා හදිසි අවස්ථා අරමුදලින් ලබාගත් අත්තිකාරම් අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 හා 11 පියවීම.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 240 - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | |
| වැඩ සටහන | 2 - | සංවර්ධන වැඩසටහන | |
| ව්‍යාපෘතිය | 3 - | ගිණුම්කරණ සහායන් | |
| | | මුළු වියදම = | රු. 55,000,000 |

(රුපියල් මිලියන පනස් පහක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 මාර්තු මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

*

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති,— 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2016 මැයි මස 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගංගා ආශ්‍රිතව අනවසර වැලි ගොඩ දැමීම්, මැණික් ගැරීම් හා රත්‍රන් කැණීම් සිදුවන බවත්;

(ii) මේ නිසා එම ගංගාවන්ට විශාල වශයෙන් හානි සිදුවන බවත්;

(iii) එය ජන ජීවිතයට ද සෘජුව බලපාන බවත්;

(iv) වගකිව යුතු ආයතන තුළ එම අකටයුතුකම් වැළැක්වීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගා ආශ්‍රිතව සිදුවන උක්ත අකටයුතුකම් මැඬලීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවරයන් කවරේද;

(iii) 2013.01.01 දින සිට 2014.06.30 දින දක්වා (අ)(i)හි සඳහන් වැරදි පිළිබඳ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සම්බන්ධව ගත් නීති ක්‍රියාමාර්ග, එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත පරිසර හානි මැඬලීමට දැනට පවත්නා නීති පද්ධතිය ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, පවතින නීති වෙනස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

355/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවගේ නිවාස ඇතුළු පොදු පහසුකම් සැපයීම පිණිස සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංවර්ධන අරමුදලින් මූල්‍යාධාර ලබා දුන්නේද;

(ii) එම ආධාර මුදල් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතීන් කවරේද;

(iii) එම එක් එක් නිවාස ව්‍යාපෘතීන් සඳහා වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

445/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය බැංකුවලින් සමූපකාර ව්‍යාපාරයට ලබාදී තිබූ සියලුම ණය කපා හැරීමට ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේද;

(ii) ඒ බව සනාථ කරමින් එවකට විෂයභාර අමාත්‍යවරයා වූ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනු ලැබුවේද;

(iii) එක් එක් සමූපකාර සමිතිවලින් කපා හරින ලද ණය පිළිබඳ යථා තත්ත්වය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර දැනුම් දෙන බව කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවට දන්වනු ලැබුවේද;

(iv) මහජන බැංකුව විසින් සමූපකාර සමිතිවලට ලබාදී තිබූ ණය කපාහැරීමට තීරණය කර ඇති නමුත් එම තීරණය මේ දක්වා කිසිදු දිස්ත්‍රික්කයක ක්‍රියාත්මක වී නොමැති බවට රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී දෙන ලද පිළිතුර නිවැරදිද;

(v) ඉහත (iv) හි තීරණය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ණය කපාහැරීමෙන් සමූපකාර සමිතිවලට යම්කිසි ධෛර්යයක් ලබාදීමට ගත් තීරණය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ඉදිරි පියවර සමූපකාර සමිතිවලට දන්වා යවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

448/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කරන ලද දිනය කවරේද;

(ii) එදින සිට මේ දක්වා එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ක්‍රීඩාංගණය විවෘත කළ දින සිට මේ දක්වා පැවති ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා තරඟවලින් ඉපයූ ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

453/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට, ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන නිදහස් වෙළඳ ගිවිසුම් මගින්, අහිමි වී ඇතැයි සැලකෙන බදු ආදායම වර්ෂ 2005 සිට 2015 දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ආරම්භ වූ දින සිට මේ දක්වා, රේගු දෙපාර්තමේන්තුවට අහිමි වී ඇතැයි සැලකෙන බදු ආදායම කොපමණද;

(iii) ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයේ සිට මේ දක්වා, ආනයන-අපනයන සහ දෙරට අතර වෙළඳ ශේෂය පිළිබඳ රේගු දත්තයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

467/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2001 සිට 2016 දක්වා සෑම වසරකම ජනවාරි පළමු දිනට—

(i) ලෝක වෙළඳපොළේ බොරතෙල් බැරලයක මිල ඩොලර් සහ රුපියල් වලින් කොපමණද;

(ii) දේශීය වෙළඳපොළේ පෙට්‍රල් සහ ඩීසල් ලීටරයක මිල රුපියල් වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

494/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළදී ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව විසින් කාල සීමාව ඉක්මවූ (Overage) වාහන ගෙන්වීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රහිමියන්ගේ නම්, ලිපින සහ බලපත්‍ර නිකුත් කරන ලද වාහන වර්ගය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

511/'16

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිගම, වෙල්ලක්කා, සමගි මාවතේ පදිංචි ජේ. ජී. ජයන්ත මහතා 2000.07.26 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය සඳහා කොන්දොස්තරවරයකු ලෙස එක් වූ බවත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අකුරැස්ස ඩිපෝවට අනුයුක්තව ඔහු සේවය කළ බවත්, තම අසනීප තත්ත්වය හේතුවෙන් සෞඛ්‍යමය හේතු මත 2015.01.01 දින වසර 15ක නොකළැල් සේවා කාලයකින් පසුව ඔහු විශ්‍රාම ගත් බවත්;

(ii) පසුගිය අවුරුද්ද පුරාම අදාළ බලධාරීන් වෙත ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළද විශ්‍රාම ලබන විට ඔහුට ගෙවිය යුතු පාරිතෝෂික දීමනාව මේ දක්වා ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රමාදයකින් තොරව, මෙම පාරිතෝෂික මුදල සම්පූර්ණයෙන්ම ගෙවනු ලබන්නේද;

(ii) එසේ නම්, එම දීමනාව ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කළ මුළු මුදල කොපමණද; එම ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියට අදාළව ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iv) එම එක් එක් මූලාශ්‍රයෙන් ලබා ගත් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මුදල් ලබා ගත් මූලාශ්‍රයන් ඉදිරිපත් කළ කොන්දේසි වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග ඉදිකිරීම්වලදි දූෂණ හා වංචා රැසක් සිදු වී ඇති බවත්;

(ii) ප්‍රමිතිය සම්බන්ධ ගැටලු ඇති බවත්;

(iii) ව්‍යාපෘති නිසා ඉඩම් හා දේපල අහිමි වන ජනතාවට වන්දි හා වෙනත් සහන ලබාදීම අවම මට්ටමක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) උක්ත (අ)(i) හි සඳහන් ව්‍යාපෘතිවලදී ජනතාවට වන්දි හා වෙනත් සහන ලබාදීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සංවර්ධන ව්‍යාපෘති නිසා පීඩාවට පත් ජනතාවට ලබා දෙන සහන වැඩි කිරීමට එතුමා පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද; කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

449/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.14 දින මාතර දී පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහන සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එහිදී සිදුවූ මූල්‍යමය අක්‍රමිකතා පිළිබඳව සෙවීමට ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය විසින් මූලික විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) JP/E/NAITA/AW/2014/20 දරන විගණන විමසුම මඟින් විගණකාධිපතිවරයා අනාවරණය කළ මූල්‍ය අක්‍රමිකතා කවරේද;

(iv) මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 100කට වඩා වියදම් කිරීම සම්බන්ධයෙන් NAITA සභාපතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබේද;

(v) එසේ නම්, ඒ කවර දිනයකදීද; එම පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

(vi) රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව, ලයිට් හවුස් නමැති පුද්ගලික සමාගම තෝරා ගැනීමේදී NAITA ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වංචනික ක්‍රියාවක් සිදුකර ඇති බැවින් ඇයට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(vii) නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

454/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සැර මත්වතුර සහ ධාන්‍ය මත්වතුර ප්‍රමාණය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ලීටර් මිලියන කොපමණද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී එකී මත්වතුර දෙවර්ගයෙන්, ලැබූ සුරාබදු ආදායම, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල් මිලියන කොපමණද;

(iii) 2015 වර්ෂයේදී සැර හා ධාන්‍ය මත්වතුර නිෂ්පාදනය ඉහළ යෑමට තුඩුදුන් හේතූන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

469/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 15, මට්ටක්කුලිය, 1 වැනි පටුමග, කදිරානවත්ත, අංක 1/90 ඩී දරන ස්ථානයේ පදිංචි, එම්. එන්. එම්. හකීම් මහතා (ජා. හැ. අංක - 820881966V) 2009.03.21 දින කොළඹ, මෝදර පොලිස් බලප්‍රදේශයේදී ඔහුගේ අංක 200-5464 දරන ත්‍රීවීලර් රථය සමඟ පැහැරගෙන යෑම සම්බන්ධයෙන් ඔහුගේ සහෝදරයා වන, මොහොමඩ් ෆර්සාන් මහතා විසින්, මෝදර පොලිස් ස්ථානයේ 2009.03.21 දින අංක CIB/83/371 යටතේ පැමිණිල්ලක් කරන ලද බවත්;

(ii) පොලිස් මූලස්ථානයේ, සිවිල් අපරාධ කොට්ඨාසය මඟින් අංක C8/310/2010 හා 2010.08.05 දිනැති ලිපියකින්, මෙම පැහැර ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා කොළඹ දිසා භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අංකය යටතේ මෝදර පොලිස් ස්ථානයේ කරන ලද පැමිණිල්ලේ සහ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ සිදුකරන පරීක්ෂණයේ වර්තමාන ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

472/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම ගුවන් ගමන් වලින් පාඩු ලබන අතරේ ආහාර සැපයීම, ඉංජිනේරු සේවා සහ ගුවන් තොටුපළ සේවා යන ක්ෂේත්‍රයන්හි ලාභ ලබන බව පිළිගන්නේද;

(ii) ගුවන් ගමන් සේවය තවදුරටත් සී/ස ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම තුළ රඳවාගෙන ඉහත (i) හි සඳහන් අනෙකුත් ක්ෂේත්‍ර විකුණා දැමීමේ සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, එයින් සිදු වන්නේ එම සමාගමේ අලාභය තවදුරටත් ඉහළ ගොස් භාණ්ඩාගාරය මත ඇති පීඩනය ඉහළ යෑම බව පිළිගන්නේද;

(iv) ශ්‍රී ලන්කන් ගුවන් සේවය විකිණීමේ සැලසුමක් තිබේද;

(v) එසේ නම්, එම සැලසුමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මැයි මස 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

106/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ දකුණු කොරියාවේදී හා මැලේසියාවේදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණ වලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ දකුණු කොරියාවේදී හා මැලේසියාවේදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හි දී ඔවුන් කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

236/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 ජනාධිපතිවරණය පාදක කර ගනිමින් දිවි නැගුම දෙපාර්තමේන්තුව මඟින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ ඡායාරූපය සහිත ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කොට රුපියල් 29,400,000ක මුදලක් අවභාවිතා කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂය සඳහා සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 18ක් අතර බෙදා හැරීමට ලිත් ලක්ෂ 50 මුද්‍රණය කළ හේතුව කවරේද;

(ii) අදාළ වියදම අනුමත කළ බලධාරියා කවුරුන්ද;

(iii) ඔහුට එම මුදල අනුමත කිරීමේ බලය තිබේද;

(iv) මෙම ලිත් ලක්ෂ 50 මුද්‍රණය කළ ආයතනය කවරේද;

(v) ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිවි නැගුම අරමුදලේ මුදල් තම පක්ෂයේ මැතිවරණ ප්‍රවර්ධනයට යොදා ගැනීමෙන් සිදු කර ඇති මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් සිදු කරනු ලබන විමර්ශනයේ ප්‍රගතිය කවරේද;

(ii) අදාළ දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය මඟින් මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එහිදී ගත් විනය ක්‍රියාමාර්ගය කවරේද;

(iv) මේ සඳහා වියදම දරා ඇත්තේ දිවි නැගුම අරමුදලින් නම්, සිදු වූ පාඩුව පියවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

364/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 ජූලි මස දඹුල්ලේ පැවති ඉන්දු-ශ්‍රී ලංකා ක්‍රිකට් තරඟාවලිය අතරතුර, ජූලි 18 දින රාත්‍රියේ ඉන්දීය ක්‍රීඩකයෙකු රැඳී සිටි කණ්ඩලම හෝටල් කාමරයක් තුළට කාන්තාවක් ගිය බවත්, ඇය රැය පහන්වන තුරු එහි රැඳී සිටි බවත්;

(ii) මේ සම්බන්ධයෙන් එවකට ක්‍රිකට් ක්‍රීඩා ආරක්ෂක උපදේශකවරයා විසින් එවකට ක්‍රිකට් ලේකම්වරයාට පිටපත් සහිතව ඉන්දීය කළමණාකරුට ලිඛිතව දැනුම් දුන් බවත්;

(iii) එම ලිපියෙහි අන්තර්ගතය අනුව අල්ලස් ලබාදීමේ උත්සාහයක් තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන්,

(i) තරඟාවලිය සංවිධානය කළ රටෙහි ක්‍රිකට් ලේකම්වරයා විසින් ගත් පියවර කවරේද;

(ii) ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් ගත් පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණවල ලිඛිත වාර්තා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතුව තිබේද;

(ii) එසේ නම්, ඒවා ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, එම වාර්තා විනාශ කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු වන්නේ කවුරුන්ද;

(iv) වාර්තා විනාශ කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කරන්නේද;

(v) එම පරීක්ෂණයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තනතුරක් දරන්නෙකු වරදකරුවකු වුවහොත් ඔහු තනතුරෙන් ඉවත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

378/’15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට ජාතික නිවාස දෙපාර්තමේන්තුව මගින්, 1984.01.01 දින මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රඹුකේඇල, පන්සල්තැන්නවත්ත නිවාස යෝජනා ක්‍රමය යටතේ, සුදුසුකම් ලැබූ පුද්ගලයින්ට පදිංචිය සඳහා ඉඩම් කට්ටි ලබාදුන් බවත්;

(ii) මීට වසර විසිපහකට පෙර දීමනා පත්‍ර නිකුත් කිරීමේ පදනමින් ලබාදී ඇති, එම ඉඩම් කට්ටිවල පදිංචිකරුවන් සඳහා ස්ථිර ඔප්පු ප්‍රදානය කිරීම මෙතෙක් සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පදිංචිකරුවන්ගේ ඉඩම් සඳහා කඩිනමින් ඔප්පු ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

417/’16

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට 2015.12.31 දින දක්වා රාජ්‍ය සේවකයින්ට, කලාකරුවන්ට සහ ව්‍යාපාරිකයින්ට එරෙහිව පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට (FCID) ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් පරිදි චෝදනාවට ලක් වී ඇති රාජ්‍ය සේවකයින්ගේ, කලාකරුවන්ගේ සහ ව්‍යාපාරිකයින්ගේ නම්, වෙන් වෙන් වශයෙන් සභාගත කරන්නේද;

(iii) පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් විමර්ශන අරඹා ඇති රාජ්‍ය සේවකයින්, කලාකරුවන් සහ ව්‍යාපාරිකයින් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විමර්ශනවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

422/’16

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණයේදී රජයේ සේවකයන්ට ලබාදීමට පොරොන්දු වූ රු.10,000/=ක මුදලින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 අනුව රාජ්‍ය, සංස්ථා, මණ්ඩල, පළාත් ආයතන හා රජය සතු සමාගම්වලට ලබාදුන් රු.8000/=ක මුදල රාජ්‍ය ව්‍යාපෘතිවල කාර්ය මණ්ඩලවලට ලැබී නොමැති බවත්;

(ii) පෙර වැටුප් වැඩිවීම්වලදී ව්‍යාපෘතිවල සේවකයින්ටද එම වැටුප් වැඩිවීම් ලබාදීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) අනුව වැටුප් වැඩිවීම ලබා දී මාස 10ක කාලයක් ගතවී ඇතත්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලවලට එය ලබා නොදීමට බලපෑ හේතු කවරේද;

(ii) එම වැටුප් වැඩිවීම ව්‍යාපෘති සේවකයින්හට ලබාදීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(iii) අදාළ වැටුප් වැඩිවීම රාජ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා කඩිනමින් ලබාදීමට පියවර ගන්නේද;

(iv) දැනට වසර 02ක කාලයක් පුරා අත්හිටුවා ඇති ව්‍යාපෘතිවලට අදාළව සකස් කොට ඇති යෝජිත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

428/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගත් භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේදී නව මුදල් නෝට්ටු මුද්‍රණය කර සංසරණයට එක් වීමෙන් උද්ධමනය ඉහළ යන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

436/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ වසර විස්සකට වැඩි සේවා කාලයක් සපුරා වයස අවුරුදු 55 ඉක්මවූ සේවකයින්ට විශ්‍රාම වැටුපක් ලැබෙන බවත්;

(ii) එසේ විශ්‍රාම යන සේවකයාට හෝ සේවිකාවට විශ්‍රාම වැටුප ලැබෙනුයේ ඔවුන් ජීවත් වන කාලය තුළ පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යම් හෙයකින් විශ්‍රාමිකයා ඉතාමත් කෙටිකාලයකින් මියගියහොත්, කිසිදු පිළිසරණක් නොමැතිව අන්ත අසරණ තත්ත්වයකට පත් වන ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයා හා දූදරුවන්ට එම විශ්‍රාමයේ ප්‍රතිලාභය ලබාදිය නොහැකිද;

(ii) ඒ සඳහා එකී විශ්‍රාම වැටුප් ක්‍රමයේ වෙනසක් සිදු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015.08.18 දින ගාල්ල වරාය පොලිසිය කරන ලද පරීක්ෂා කිරීමක දී වරායේ ගාල් කර තිබූ "මහනුවර" නමැති නෞකාව තුළත්, ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ සහ එහි සේවා වනිතා ඒකකය සතු ගොඩනැගිල්ලක අවි සහ උණ්ඩ තිබී හමු වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලිසිය මඟින් අනාවරණය කරගත් අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය කවර පුද්ගලයෙකු හෝ ආයතනයක් සතු වන්නේද;

(ii) එම අවි ආයුධ පුද්ගලයෙකුට හෝ ආයතනයකට කවර පනතක් යටතේ පවරා තිබේද;

(iii) එසේ නම්, ඊට බලය ලබා දුන් බලධරයා කවුරුන්ද;

(iv) එම ආයුධ නිෂ්පාදිත රට, වර්ෂය සහ බලපත්‍රය කවරේද;

(v) ආයුධ මිලදී ගත් ක්‍රමය සහ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාවෙන අවි ගබඩාව වරාය පරිශ්‍රයේ පවත්වාගෙන යාමට අවසර තිබේද;

(ii) ඊට අවසර ලබා දී ඇති බලධරයා කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් ඇවන්ට්ගාර්ඩ් සමාගම මුදල් ගෙවන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ පිළිබඳව නීතිපතිවරයාගේ නිගමනයන් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් පිළිගන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

95/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හේන් වගාව, සතුන් දඩයම් කිරීම හා විවිධ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තරවලට හානි සිදු වන බවත්;

(ii) එම හානි වළක්වා ගැනීමට නොහැකි වී ඇත්තේ ඉහළ නිලධාරීන්ගේ හා දේශපාලනඥයන්ගේ මැදිහත් වීම නිසා බවත්;

(iii) උක්ත වන හානිය සමස්ත ශ්‍රී ලංකාවේම දේශගුණික, ආර්ථික හා සමාජීය වශයෙන් බලපෑම් ඇති කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර දෙකක කාලය තුළ මෙම වනාන්තර තුළ දඩයම් කිරීම හා හේන් වගා කිරීම සම්බන්ධව නීතිය ඉදිරියේ වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත තුළ දඩයම් කිරීම හා හේන් වගාව නැවැත්වීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රක්ෂිතයන්හි ආරක්ෂාව සඳහා දැනට තිබෙන මානව හා භෞතික සම්පත් සම්බන්ධව සෑහීමකට පත්වන්නේද;

(ii) නොඑසේ නම්, රක්ෂිතයන්හි ආරක්ෂාව තර කිරීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

311/'15

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2000.11.29 වැනි දින ත්‍රිකුණාමලය ප්‍රදේශයේ මුහුදු සීමාවේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක් වීමෙන් "තුෂාරි" නමැති ධීවර බෝට්ටුව විනාශ වී එහි සිටි ධීවරයින් අතුරුදහන් වූ බවත්;

(ii) මෙම සිදුවීම සත්‍ය බවත්, අදාළ ධීවර කාර්මිකයින්ගේ යැපෙන්නන්ට වන්දි ලබා දීම සුදුසු යැයි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ජී. පියසේන මහතා විසින් අංක ධීජදෙ/සැ/02/06 ඩීආර් හා 2003.01.10 දිනැති ලිපිය මඟින් පිළිගෙන ඇති බවත්;

(iii) අතුරුදන් වූ ධීවරයින් අතරින් කුමාරගේ දොන් පියරත්න නමැති අය සඳහා මේ වනතෙක් වන්දි මුදලක් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට කටයුතුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පියරත්න මහතාගේ වැන්දඹු බිරිඳ වන කේ.එම්. බ්‍රිජට් කාන්ති මහත්මිය විසින් හිටපු ජනාධිපතිතුමාට හා හිටපු අමාත්‍යතුමාට ලිඛිත අභියාචනා ඉදිරිපත් කළත්, ඒ සම්බන්ධයෙන් සාධාරණ පියවරක් නොගැනීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඇයට වන්දි මුදලක් ගෙවීමටත්, මියගිය ස්වාමියාගේ මරණ සහතිකය ලබා දීමටත් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

328/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2018 පොදුරාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීම වෙනුවෙන් සිදු කරන ලද පූර්ව ප්‍රචාරක සහ අනෙකුත් කාර්යයන් සඳහා පසුගිය රජයේ මැදිහත්වීමෙන් මුදල් එකතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ එකතු කරන ලද මුදල් භාවිතා කරමින්, බටහිර ඉන්දීය කොදෙව් දූපත්, St. Kitts සහ Nevis යන ස්ථානවල සංචාරයන් සංවිධානය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඊට සහභාගි වූවන්ගේ නම් සහ වැය වූ මුළු මුදල කවරේද;

(iii) මෙම මුදල් යොදා ගනිමින් ගෙවීම් කරන ලද පුද්ගලයින්ගේ නම් සහ ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ විමර්ශන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

332/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුනාමියෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කරන ලද සිරිබෝපුර ගම්මානයේ (සුවී ගම්මානයේ) ජීවත්වන මුස්ලිම් දරුවන්ට මූලික අධ්‍යාපනය හැදෑරීම පිණිස දෙමළ මාධ්‍ය ප්‍රාථමික පාසැලක් ස්ථාපිත කිරීම සුදුසු යැයි හම්බන්තොට අධ්‍යාපන කලාපයේ ව්‍යුහ කමිටුව 2009.04.29 දින තීරණයක් ගෙන තිබෙන බවත්;

(ii) ඒ අනුව, හම්බන්තොට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක හ/හම්/කලාප/සැවි01/ව්‍යුහ/08 හා 2009.04.29 දිනැති නිර්දේශය, දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම අංක දප/සැවි/01 හා 2009.06.29 දිනැති ලිපිය මඟින් පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමතිය සඳහා යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් කාරණය සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර හා එහි ප්‍රගතිය කවරේද;

(ii) අනුමත යෝජනාව මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ හේතු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය මඟින් සොයා බලා ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

340/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලිට්රෝ ගෑස් සමාගම සහ ලංකා රෝහල (Lanka Hospitals) පෞද්ගලීකරණය කිරීමට රජය තීරණය කර තිබේද;

(ii) ලාභ ලබන රාජ්‍ය ආයතනද පෞද්ගලීකරණය කිරීමට රජයේ අවධානය යොමු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

371/'15

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට දිවයිනේ ඒ ඒ පළාත් සහා බලප්‍රදේශ තුළ ඇති මුළු ලියාපදිංචි පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙරපාසල් අතරින් ළමුන් 50ට වැඩි පෙරපාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 පෙබරවාරි මස අතුරු අයවැයෙන් පෙරපාසල් ගුරුවරුන් සඳහා ලබාදීමට නියමිත රු.250/=ක දීමනාව ගෙවීම සඳහා වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(ii) අදාළ දීමනාව ලැබීමට සුදුසුකම් ලබා ඇති පෙරපාසල් ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම මාසික දීමනාව ගුරුවරුන් වෙත ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

377/'15

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේදී බස්නාහිර පළාත් සභාව මඟින් උපාධිධාරීන්ට ගුරු පත්වීම් ලබාදීම සඳහා පැවැත්වූ තරඟ විභාගයට පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) සමත් වූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සමත් වූ සියලු දෙනාට මේ වනවිට පත්වීම් ලබාදී තිබේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014.12.27 බස්නාහිර පළාත් සභාව මගින් උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා පැවති තරඟ විභාගයට පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) සමත් වූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(iv) පත්වීම් ලබා දී නොමැති නම්, එයට හේතු කවරේද;

(v) ඔවුන්ට පත්වීම් ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (i) හි සඳහන් විභාගයෙන් ගුරු පත්වීම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ නොකළ උපාධිධාරීන්ට බස්නාහිර පළාත් සභාවේ සංවර්ධන නිලධාරි පත්වීම් ලබාදුන් බව දන්නේද;

(ii) ඉහත ආ (i) හි සඳහන් විභාගයෙන් සමත් නොවූ උපාධිධාරීන්ද එලෙස බස්නාහිර පළාතේ රාජ්‍ය ආයතනවල සංවර්ධන නිලධාරින් ලෙස බඳවා ගැනීමට පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

404/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ පාසල් තෝරා ගැනීමට යොදා ගත් නිර්ණායකයන් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ නාවලපිටිය මැතිවරණ කොට්ඨාසයේ, ගඟ ඉහළ කෝරළේ හා පස්බාගේ කෝරළේ අධ්‍යාපන කොට්ඨාසවලින් තෝරාගත් පාසල් මොනවාද;

(iii) ගම්පොල අධ්‍යාපන කලාපය හා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිර්ණායක අනුව තෝරාගත් පාසල් අධ්‍යාපන අමාත්‍යවරයාගේ මැදිහත් වීමෙන් වෙනස් කළ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යවරයාගේ මැදිහත් වීමෙන් අලුතින් නම් කරන ලද පාසල් දෙක තෝරා ගත්තේ අ (i) ට අනුව සඳහන් කළ නිර්ණායකවලට අනුකූලවද;

(ii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

107/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ මැදපෙරදිග කලාපයට අයත් රටවලදී මියගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ මැදපෙරදිග කලාපයට අයත් රටවලදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රටට වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හි දී ඔවුන් කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයින් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

344/’15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු පළාතේ, මුලන්කාවිල්, නාච්චිකුඩා, කිලිනොච්චි, කිලි/රජයේ මුස්ලිම් මිශ්‍ර පාසලෙහි,

(i) බාලාංශයේ සිට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා 500කට ආසන්න ශිෂ්‍යයින් සංඛ්‍යාවක් ඉගෙනුම ලබන බවත්;

(ii) සුදුසු ගොඩනැගිලි පහසුකම් නොමැති වීම හේතුවෙන් තාවකාලික ටකරන් මඩුවක පන්ති පවත්වන බවත්;

(iii) ඉංග්‍රීසි, භූගෝල විද්‍යාව, අරාබි භාෂාව සහ ඉස්ලාම් ධර්මය යන විෂයයන් සඳහා ගුරුවරුන්ගේ හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලට පන්ති කාමර ගොඩනැගිල්ලක් සහ ඉහත අ (iii) හි සඳහන් විෂයයන් සඳහා අදාළ ගුරුවරුන් නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

376/’15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) CSN නාලිකාව ලියාපදිංචි කළ දිනය කවරේද;

(ii) එම නාලිකාව ලියාපදිංචි කළ ලිපිනය කවරේද;

(iii) එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපින කවරේද;

(iv) වර්ෂ 2012-2015 දක්වා ක්‍රිකට් තරඟ විකාශන අයිතිය ලබා ගැනීම වෙනුවෙන් CSN නාලිකාව ගෙවා ඇති මුදල කොපමණද;

(v) වර්ෂ 2005-2011 දක්වා ක්‍රිකට් තරඟ විකාශනයෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලැබූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) 2011 අගෝස්තු/සැප්තැම්බර් ඕස්ට්‍රේලියා සංචාරයේ ක්‍රිකට් තරඟ විකාශන අයිතිය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඉල්ලුම් නොකළ හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මැයි මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට පවත්වාගෙන යනු ලබන සිනමාශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) රට තුළ දැනට ක්‍රියාත්මක වන සිනමා මණ්ඩල සංඛ්‍යාව කොපමණද; ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් මණ්ඩලයට අයත් සිනමාශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) චිත්‍රපටය අයත් විය යුතු මණ්ඩලය තීරණය කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චිත්‍රපටයක් ප්‍රදර්ශනය කළ යුතු සිනමාශාලා සංඛ්‍යාව කොපමණද යන්න පිළිබඳ නිශ්චිත අගයක් තිබේද;

(ii) එසේ නම්, එම පිටපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිශ්චිත සීමා ඉක්මවා යන අවස්ථා තිබේද;

(iv) එසේ නම්, එලෙස නිශ්චිත පිටපත් සංඛ්‍යාව ඉක්මවා චිත්‍රපටයක් ප්‍රදර්ශනය කළ හැකි ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එක් නිෂ්පාදකයෙකුට වැඩි අවස්ථාවක් ලබාදීම නිසා තවත් නිෂ්පාදකයෙකුට අසාධාරණයක් සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, සියලු නිෂ්පාදකයින්ට සාධාරණ පිටපත් සංඛ්‍යාවක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබාදීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

153/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වලට පාසල් පාදකව ගුරු සහායකවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවන ලදුව, අගලවත්ත, වියන්ගල්ල, අංක 25/2 දරන නිවසේ පදිංචි, එෆ්. රුෂානා මහුර් මිය විසින් ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන ලද බවත්;

(ii) ඒ අනුව ඇය සම්මුඛ පරීක්ෂණය සඳහා 2015.03.02 දින කැඳවීම් අංක 199 (B) යටතේ පෙනී සිටි බවත්;

(iii) ඇයගේ පදිංචි ප්‍රදේශයේ වතු පාසල්වල එම තනතුර සඳහා පුරප්පාඩු පැවතියද, රුෂානා මහුර් මියට මෙතෙක් ගුරු සහායක පත්වීමක් ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇයට ගුරු සහායක පත්වීම නොපමාව ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

192/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හෝමාගම, දියගම, මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයට අයත් භූමියේ විශාලත්වය කොපමණද;

(ii) එම භූමිය අයත්ව තිබූ රාජ්‍ය ආයතනය කවරේද;

(iii) එම භූමිය ක්‍රීඩා අමාත්‍යාංශයට හෝ වෙනත් රාජ්‍ය ආයතනයකට පවරාගෙන තිබේද;

(iv) එසේ නම්, එයට අදාළ ලියකියවිලි සභාගත කරන්නේද;

(v) දැනට ක්‍රීඩාංගණයේ පරිපාලනය හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) රජය වැයකළ මුදල සහ පෞද්ගලික පරිත්‍යාග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ සඳහා මුදල් වෙන්කළ අමාත්‍යාංශ කවරේද;

(iv) ඉදිකිරීම් සඳහා මුදල් ලබා දුන් පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) ක්‍රීඩාංගණය, ක්‍රීඩා කටයුතු සඳහා ලබා දීම ඇරඹූ දින සිට මේ දක්වා අයකරගෙන ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම මුදල් බැර කර ඇති ගිණුම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සම්බන්ධ "ක්‍රීඩා සංවර්ධන පදනමක්" තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා කැබිනට් අනුමතිය ලබාගෙන ඇත්තේ කවර අමාත්‍යවරයා විසින්ද; කවර දිනයකදීද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම් , ඒ මන්ද?

240/'15

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) අවදානම් මත බර තැබීමේ ක්‍රමය අනුව, ශ්‍රී ලංකාවේ විදේශ සංචිතවල ප්‍රමාණවත්භාවය පිළිබඳව සැහීමට පත්වන්නේද;

(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි, අවදානම් මත බර තැබීමේ නව ක්‍රමය යෙදීමේදී, X; STD; OPL සහ M2 යන විචල්‍යයන්හි දත්ත අනුව, වර්ෂ 2000 සිට 2014 දක්වා, පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යටතේ, විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය, එක් එක් වර්ෂය අනුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ ගෙවුන මාස 9 තුළ ශ්‍රී ලංකාවේ විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය කෙසේවිද;

(ii) එම තත්ත්වය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතූන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

333/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්වවිද්‍යාලවල අනධ්‍යයන උප ශාලාධිපතිවරුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන අනුමත නිවාඩු ප්‍රමාණයන් කවරේද;

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 912/1ට අනුව දින 90ක්ව පැවති වාර්ෂික නිවාඩු ප්‍රමාණය දින 45 දක්වා අඩු කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iv) නැවත අංක 04/2003 චක්‍රලේඛය අනුව සාමාන්‍ය රජයේ නිවාඩු, සෙනසුරාදා, ඉරිදා, සහ පෝය දිනද ඇතුළත්ව දින 90ක් දක්වා එම නිවාඩු ප්‍රමාණය වෙනස්කර තිබේද;

(v) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ සේවකයන්ට හිමි නිවාඩුද ඔවුන්ට හිමි දින 90 තුළට ඇතුළත්කර සැලකීමෙන් එම සේවකයන්ට, වෙනත් සාමාන්‍ය සේවකයින්ට ලැබෙන වරප්‍රසාදයක් අහිමි කර ඇති බව පිළිගන්නේද;

(ii) සාමාන්‍ය රජයේ සේවකයින්ට හිමි නිවාඩු වරප්‍රසාද කප්පාදු නොකර, විශ්වවිද්‍යාල අනධ්‍යයන උප ශාලාධිපතිවරුන් සඳහා නිවාඩු ලබාදීමේ පිළිගත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

351/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව මඟින් ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට්ස් (පෞද්.) සමාගමට රුපියල් මිලියන 530ක ණය මුදලක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ කවර පදනමක් යටතේද;

(iii) එම ණය මුදල ලබාදීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) නොඑසේ නම්, එම මුදල එම සමාගමෙන් අයකර ගැනීමට ගත් පියවර කවරේද;

(vi) මේ වනවිට ගෙවා ඇති මුදල කොපමණද;

(vii) නොගෙවූ මුදල අය කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය ජනාධිපතිවරණ සමයේ දී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 700ක මුදලක් පිළිගත් ක්‍රමවේදයකින් තොරව ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම මුදල අයකර ගැනීම සඳහා ක්‍රියා පිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියා පිළිවෙළ කවරේද;

(iv) එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

370/'15

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වසරේ මහ කන්නය තුළ වී වගාකර ඇති මුළු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) එම බිම් ප්‍රමාණයට සරිලන ප්‍රමාණවත් පොහොර ඒ වනවිට රට තුළ තිබුණේද;

(iii) එසේ නම්, පොහොර හිඟයට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වී වගාව සඳහා යෙදිය යුතු මූලික මතුපිට පොහොර N.P.K. ඒ වනවිට ගොවීන්හට ලබාගැනීමට වෙළඳපොළේ නොතිබූ බව දන්නේද;

(ii) දෙවන වරට යෙදිය යුතු යූරියා පොහොර හිඟයකින් තොරව ලබාදීමට කඩිනමින් පියවර ගත්තේද;

(iii) ඒ සඳහා ගතවූ කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

392/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වසරේදී ලංකාවට ආනයනය කළ ඉන්ධන ලෙස හීලියම්, හයිඩ්‍රජන් සහ විදුලිය සම්පූර්ණයෙන්ම භාවිතා කරන වාහන සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හීලියම් පමණක් භාවිතා කරන වාහන වාණිජ මට්ටමින් වෙළඳපොළට හඳුන්වා දී ඇති සමාගම් සහ එකී වාහන වෙළඳපොළට හඳුන්වා දුන් වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) හයිඩ්‍රජන් පමණක් භාවිතා කරන වාහන වාණිජ මට්ටමින් වෙළඳපොළට හඳුන්වා දී ඇති සමාගම් සහ එකී වාහන වෙළඳපොළට හඳුන්වා දුන් වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) හයිඩ්‍රජන් සහ හීලියම් පමණක් භාවිතා කරන වාහනවල අවම මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

410/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වතුකරයේ දැනට පවුල් 400,000ක් (ලක්ෂ හතරක්) පමණ ඉඩම් නොමැතිව සිටින්නේද;

(ii) ඔවුන්ට දෙන ලද පොරොන්දුව අනුව ක්ෂණිකවම පර්චස් 07ක ඉඩම් කොටසක් එම පවුල්වලට ලබාදී එම ඉඩම් විකිණිය නොහැකි කොන්දේසි වලට යටත් කර ඉඩම් භාරයක රඳවා තබමින් එකී පවුල්වල එක් අයෙකුට එකී ඉඩමේ පසු අයිතිය පැවරීමේ අවසරයක් ලබාදිය නොහැකිද;

(iii) එකී ඉඩමේ ඉදිකිරීම් අභිමත පරිදි කර ගැනීමට එම ඉඩම්ලාභීන්ට ඉඩ සලසා එකී ඉදිකිරීම් පමණක් විකිණීමේ අයිතිය ඉඩම්ලාභීන්ට ලබාදිය නොහැකිද;

(iv) එසේ ඉඩම් විකිණීම වළක්වන නීති පනවමින්, එහෙත් ඒ මත සිදුකරන ඉදිකිරීම් පමණක් විකුණා ගැනීමට ඉඩහැරීමෙන්, ඉඩම්වල මිල ඉහළ නොයවමින්, තම උවමනාවන් සඳහා උකස් කිරීම් ආදියට ඉඩ සලසමින්, ඉඩම් විකිණීම වැළැකිය හැකිවන පරිද්දෙන් ක්‍රියාකළ හැකි නොවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉන්දියාවේ අනුගමනය කරන මෙබඳු වූ ඉඩම් භාර ප්‍රතිපත්තියෙන් අපට ආදර්ශයක් ගත නොහැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පොම්ප කැලේ රක්ෂිතයේ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එහි ඇති ඒකදේශික ශාක මොනවාද;

(iii) පොම්පකැලේ රක්ෂිතයේ වාසය කරන ඒකදේශික සතුන් වර්ග කවරේද;

(iv) මෙම වනාන්තරය රක්ෂිතයක් ලෙස නම් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014.04.14 දිනට පසු දිනක පොම්ප කැලේ රක්ෂිතයේ අක්කරයකට වැඩි ප්‍රමාණයක් එළිකොට ඇති බවත්;

(ii) එම එළිකිරීම සිදු කර ඇත්තේ රක්ෂිතයේ ජෛවීය වැදගත්කමක් ඇති ඉහළ කොටසේ බවත්;

(iii) එම නිසා විශාල පරිසර හානියක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) පොම්පකැලේ රක්ෂිතයේ මෙම විනාශය සිදු කර ඇත්තේ කවුරුන් විසින්ද;

(ii) ඒ කුමන පරමාර්ථයක් සඳහාද;

(iii) මෙම වන විනාශයට අවසර ලබා දුන් නිලධාරීන් වේ නම්, ඔවුන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තනතුරු කවරේද;

(iv) පොම්ප කැලේ රක්ෂිතයේ විනාශය නැවැත්වීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

375/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයින් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

395/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජෝර්ජ් සෝරොස්,

(i) එක්සත් රාජධානියේ භාණ්ඩාගාරයට පවුම් බිලියන 3.4 ක පාඩුවක් සිදුකිරීම, එක්සත් රාජධානියට යුරෝපීය විනිමය යාන්ත්‍රණයෙන් ඉවත් වීමට කටයුතු සැලසීම මෙන්ම, 1992.09.16 දින, සිදුවූ පවුමේ දැවැන්ත අවප්‍රමාණයට වගකිවයුතු පුද්ගලයා ලෙස හඳුනා ගෙන ඇති බවත් ;

(ii) 1997 ආසියානු මූල්‍ය අර්බුදය ඇති කළ පුද්ගලයා ලෙසට ආණ්ඩු ප්‍රධානීන් සහ ආර්ථික විශේෂඥයින් චෝදනා කළ බවත්;

(iii) 2006 දී ප්‍රංශ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොටස් වෙළඳපොළේ වංචාවක් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරු කළ බවත්;

(iv) 2016 ජනවාරි මස පැවති ආර්ථික සමුළුවක සුවිශේෂී ආරාධිතයා ලෙස සහභාගි වන මෙන් ඔහුට රජය විසින් ඇරයුම් කරනු ලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එවැනි වංචනික පුද්ගලයෙකුට සුවිශේෂී ආරාධිතයා ලෙස ඇරයුම් කිරීම යහපාලන සංකල්පයට ගැලපේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

408/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අංක S/C 2008 සහ 2008.10.24 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව අනුව, භාණ්ඩාගාර විවිධ වියදම් වැය අයිතම (TMV) මඟින් ලබා දෙනු ලබන විශේෂිත ප්‍රතිපාදන, අදාළ අමාත්‍යාංශය සඳහා වන අතිරේක ප්‍රතිපාදනයන් වේ. 2008 විසර්ජන පනතේ 6(1) වගන්තිය ඒ අනුව සංශෝධනය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කරුණු අනුව 2015 වර්ෂය තුළදී අතිරේක ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශ කවරේද;

(ii) අමතර ප්‍රතිපාදන ලබාදුන් අරමුණු එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ ලබාදුන් අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විශේෂ වියදම් ඒකක වන අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරු යන අයිතමයන් සඳහා 2015 වර්ෂයේදී අතිරේක ප්‍රතිපාදනයන් ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

430/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 05 වන දින සන්ධ්‍යාවේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා අංශයේ ප්‍රධානියාගේ කාර්යාලයට වරාය අධිකාරිය විසින් මුද්‍රා තැබූ බව දන්නේද;

(ii) එසේ නම්, එලෙස මුද්‍රා තැබීමට හේතු කවරේද;

(iii) එසේ නොවේ නම්, 2010 හම්බන්තොට "කරදියවර" මංගල්‍යයට අදාළ පරීක්ෂණයක් සඳහා එම කාර්යාලයේ ලිපිගොනු රැගෙන ගොස් තිබේද;

(iv) එම කාරණයට අදාළව, මීට පෙර මහා පරිමාණ දූෂණ හා වංචා විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිසම මඟින් පරීක්ෂණයක් කර තිබියදී නැවත එම ලිපිගොනු රැගෙන යාමේ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම සිද්ධිය සම්බන්ධව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මාධ්‍ය ඒකකය මඟින් ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කිරීමේ අවශ්‍යතාවය කවරේද;

(ii) එසේම, එම ඒකකයේ ප්‍රධානියා ලවාම එවැනි සිද්ධියක් නොවූ බවට ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කිරීමේ අවශ්‍යතාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 මැයි මස 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රණවිරු සේවා අධිකාරියේ සේවය කරන ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2013 හා 2014 දී එම අධිකාරියේ ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සැපයීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල ඇඳුම් ලබා දුන් ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය, කාන්තා සහ පිරිමි ලෙස කාණ්ඩගත කල විට එක් එක් කාණ්ඩයේ එක් අයෙකු වෙනුවෙන් නිල ඇඳුම් සඳහා දරනු ලැබූ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල ඇඳුම් සඳහා තෝරාගත් රෙදි තත්ත්වයෙන් බාල බවත්;

(ii) එම නිසා නිලධාරීන් එම ඇඳුම් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

(iii) අධිකාරියේ සභාපතිනිය අත්තනෝමතිකව කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) රණවිරු සේවා අධිකාරියේ නිල ඇඳුම් ගැටළුව විසඳීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

238/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් අංක GB-2865 දරන ඩිෆෙන්ඩර් රථය මාස 03ක කෙටිකාලීන පරිහරණයට ලබාගත් හිටපු අමාත්‍යවරයෙකු හා තවත් හිටපු අමාත්‍යවරයෙකු විසින් වසර 06ක් අනවසරයෙන් භාවිතා කොට, පසුව එහි රෝද හතර ඇතුළු බොහෝ කොටස් ගලවා ඉවත් කර, වැසිය පමණක් පසුගිය 2015 ජනාධිපතිවරණයෙන් පසුව නොදන්වා, ආපදා රථයකින් රැගෙන විත් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ භූමියෙහි අතහැර ගොස් තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිල වශයෙන් අංක GB - 2865 දරන ඩිෆෙන්ඩර් රථය නිදහස් කර තිබූ අමාත්‍යවරයාගේ නම කවරේද;

(ii) එම රථය අනවසරයෙන් කොපමණ කාලයක් භාවිතා කර තිබේද;

(iii) ඒ සම්බන්ධයෙන් ආයතන මට්ටමින් ගෙන තිබූ පියවර කවරේද;

(iv) එම වාහනයේ කොටස් ගලවා ඉවත් කිරීම හේතුවෙන් සිදුවූ අලාභය කොපමණද;

(v) එම අලාභය අය කර ගැනීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙන තිබූ පියවර කුමක්ද;

(vi) මෙම රාජ්‍ය දේපළ සාපරාධී පරිහරණය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන විමර්ශනයේ වත්මන් ප්‍රගතිය කවරේද;

(vii) ඒ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා ලෙස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

357/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සරණාගතයින් ලෙස විදේශ රටවල පුරවැසිභාවය අයදුම්කර සිටින ශ්‍රී ලාංකිකයින්, ශ්‍රී ලාංකිකයින් ලෙස පිළිගන්නේද;

(ii) එසේ නම්, එවැනි අය සඳහා තානාපති කාර්යාලවල සේවය ලබාදිය යුතු බවට චක්‍රලේඛයක් තිබේද;

(iii) එම චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තු වන්නේද;

(iv) එසේ නම්, චක්‍රලේඛය ඉවත් කිරීමට බලාපොරොත්තුවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

423/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013, 2014 සහ 2015 වර්ෂයන්හිදී වාර්තාවූ මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, හදිසි අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත වර්ෂයන්හිදී හදිසි අනතුරුවලින් සිදුවූ මරණ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

438/'16

ගරු විජිත හේරත් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වසර සඳහා පෝෂ්‍ය පුරවැසි දීමනා වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නිකුත්කර තිබේද;

(ii) 2015 වර්ෂය සඳහා නිකුත් කළ මුදල කොපමණද;

(iii) 2016 වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉල්ලුම්කර ඇති සියලුම පෝෂ්‍ය පුරවැසියන්ට එම දීමනාව ලබා දෙන්නේද;

(ii) එසේ නොවේ නම්, යම් සීමාකිරීමක් සිදුකර තිබේද;

(iii) එසේ නම්, ඒ මන්ද;

(iv) සීමාකිරීමක් සිදුකර නොමැති නම්, ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඉල්ලුම් කරන ලද සියලු පෝෂ්‍ය පුරවැසියන් සඳහා එම දීමනාව ලබාදීමට කටයුතු කරනු ලබන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

439/'16

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව කවරේද;

(ii) එම පත්වීම්ලාභීන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම පත්වීම් බෙදා දී ඇති ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පත්වීම් ලබා දීමේදී අනුගමනය කරන ලද බඳවාගැනීමේ පටිපාටිය කවරේද;

(v) එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමේදී සලකා බලන ලද අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

442/'16

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වසරේ ලංකා හොස්පිට්ල්ස් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) 2014.01.01 සිට 2014.12.31 දක්වා පවත්වනු ලැබූ එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් එක් එක් අධ්‍යක්ෂවරයාට ගෙවා ඇති දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.08 දින සිට මේ දක්වා ලංකා හොස්පිට්ල්ස් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස කටයුතු කරන පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ එම ආයතනයේ පවත්වනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව, ඒ සඳහා සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ඒ වෙනුවෙන් ගෙවා ඇති දීමනාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

443/’16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ විවිධ රටවල පවත්වාගෙන යන ලාංකිකයන් සතු බැංකු ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ගිණුමෙහි ඇති වටිනාකම, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගිණුම් හිමියන් ශ්‍රී ලංකාවේ නීති උල්ලංඝනය කරමින් මුදල් තැන්පත් කර තිබේද;

(iv) එකී ගිණුම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

(vi) රාජ්‍යතාන්ත්‍රික මට්ටමෙන් ඉහත කී සියලු ගිණුම්වල තොරතුරු ලබා ගැනීම සඳහා රජය විසින් අදාළ රාජ්‍යයන් හරහා ඉල්ලීම් කර තිබේද;

(vii) නොඑසේ නම්, ඒ මන්ද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ස්විට්සර්ලන්තයේ HSBC බැංකුවේ ඇති ගිණුම් පිළිබඳව මා විසින් 2015.03.03 දින පාර්ලිමේන්තුවේදී කරන ලද විමසීමට පිළිතුරු වශයෙන්, ඒ සඳහා ක්‍රියා කිරීමට මූල්‍ය බුද්ධි අංශයට සම්බන්ධ නීති සංශෝධනය කරගත යුතු වන බවත්, ඊට ආසන්නම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා කටයුතු කරන බවත් පවසා සිටියේද;

(ii) එසේ නම්, එකී නීති සංශෝධනය කරනු ලැබ ඒ අනුව මේ වනවිට ගෙන ඇති පියවර සහ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

452/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 අගෝස්තු 15 දින ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 36,800ක් ලෙස තක්සේරු කර තිබූ TRJ 150W මාදිලියේ මෝටර් රථවල වටිනාකම, 2015 මාර්තු 23 දින වනවිට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 27944 (ජපන් යෙන් 3,375,000) දක්වා ඩොලර් 8836කින් අඩු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරතිබූ වාහන 407කින් සිදුවී ඇති බදු අලාභය දළ වශයෙන් රුපියල් මිලියන 3000 පමණ වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බදු අලාභය සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්ද;

(ii) රාජ්‍ය අයභාරයට මෙවැනි අලාභයක් සිදුව ඇත්නම්, ඒ හා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) කලින් පැවති තක්සේරුව අඩු කිරීම හේතුවෙන්, තීරුබදු සහන බලපත්‍රය යටතේ මේ දක්වා මෙරටට ආනයනය කරන ලද මෝටර් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

457/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රජය හා මාලදිවයින රජය අතර සිරකරුවන් හුවමාරු කර ගැනීම සඳහා අත්සන් කරන ලද ගිවිසුම අනුව මාලදිවයිනෙහි සිරභාරයේ පසුවන එම්. එම්. එම්. බිස්තාම් නමැති පුද්ගලයා ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයකට මාරු කිරීම පිණිස ඉල්ලුම් කිරීම සම්බන්ධව (Case File No. 175/2009-Court No. 194 JC-2009) අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/L2/2/3/12 හා 2014.05.30 දිනැති ලිපිය මගින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙතින් වාර්තාවක් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී සිරකරු ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයකට මාරුකරවා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

470/'16

ගරු ගාමිණී ලොකුගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිවයිනෙහි පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2016 වසරේදී පාසල් නිල ඇඳුම් වවුචර්පත්,

(i) ලබාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ලබානොගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

125/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින වාප්පු ලිපිකාර ආයතන ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයතනයන්හි නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

(iii) එම එක් එක් ආයතනය තුළ සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වාප්පු ලිපිකාර ආයතනයන්හි බලපත්‍ර අලුත් කිරීමේදී ඔවුන් රජයට ගෙවිය යුතු ගාස්තු කවරේද;

(ii) එම එක් එක් ගාස්තු කාණ්ඩයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත (අ) (ii) හි සඳහන් ආයතන 2014 වර්ෂයට බලපත්‍ර අලුත් කිරීමේදී ගෙවූ ඇපකර වටිනාකම එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ඇපකරය බැංකු ඇපකරයක්ද; නැතහොත් මුදල් ඇපකරයක්ද;

(v) මුදල් ඇපකරයක් නම්, තැන්පත් කළ බැංකුව, ගිණුමේ හිමිකාරීත්වය ඇති ආයතනයේ නම හා එම ගිණුම ජංගම, ඉතිරි කිරීමේ හෝ ස්ථාවර ගිණුමක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නව ඇපකර ගාස්තු සංශෝධනය නිසා වාප්පු ලිපිකාර ආයතනයන්ට අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ඇපකර ගාස්තු සංශෝධනයට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනක සිටද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

424/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 සහ 2015 වර්ෂයන්හි කොළඹ කොටස් වෙළඳපොළේ සමස්ත මිල දර්ශකයේ වර්ධන ප්‍රතිශතය සහ ශුද්ධ විදේශීය මිලදීගැනීම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ කොටස් වෙළඳපොළේ සමස්ත මිල දර්ශකය පසුගිය වසර තුළ පහත වැටීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය සහ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය බිඳ වැටී ඇති බවත්;

(ii) කොළඹ කොටස් වෙළඳපොළේ ශුද්ධ විදේශීය මිලදී ගැනීම් පසුගිය වසර තුළ සෘණ අගයක් ගැනීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය සහ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ විදේශීය ආයෝජකයින්ගේ විශ්වාසය බිඳ වැටී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

468/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 සහ 2015 වර්ෂවලදී,

(i) ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලය රැස්වූ අවස්ථා සංඛ්‍යාව;

(ii) වකුෆ් මණ්ඩලය විසින් විභාගයට ගනු ලැබූ නඩු/ඉල්ලීම් සංඛ්‍යාව;

(iii) වකුෆ් මණ්ඩලය විසින් විසඳුම් ලබාදුන් නඩු/ඉල්ලීම් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (ii) සහ (iii) හි නඩු/ඉල්ලීම්වලට අදාළ අංක හා දින කවරේද;

(ii) මේ වනවිට වකුෆ් මණ්ඩලයේ ඉදිරියේ විභාග වීමට නියමිත නඩු/ඉල්ලීම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?